
# තම්මැන්නාව එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම




**CMP තම්මැන්නාව**

**අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

## පටුන

## වගු ලැයිස්තුව


වගු අංක 01 - ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් එල්ලංගාව ........................................................ 7

වගු අංක 02 - ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් ගම්මාන ........................................................ 7

වගු අංක 03 - එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු ........................................................ 9

වගු අංක 04 - පුණරුත්ථාපනය කල හා නොකල වැව් ........................................................ 23

වගු අංක 05 - ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ........................................................ 23

වගු අංක 06 - එල්ලංගාවට අයත් ප්‍රදේශයේ වී නිෂ්පාදනය ........................................................ 27

වගු අංක 07 - HSAADP ව්‍යාපෘතියෙන් පසු වී නිෂ්පාදනයේ සමස්ත එල්ලංගා පාදක වැඩිවීමේ පුරෝකථනය ........................................................ 28

වගු අංක 08 අඹන්පොළ Hotspot එල්ලංගා පදනම පවතින බඩ ඉරිඟු වගා තත්ත්වය ........................ 29

වගු අංක 09 - Abanpola Hotspot එල්ලංගා පදනම පවතින වාර්ෂික රටකජු නිෂ්පාදන තත්ත්වය.........29

වගු අංක 10 - Abanpola Selicted එල්ලංගා පාදක භූමි භාවිත පැතිකඩ........................................ 30

වගු අංක 11- අබන්පොල (DSC) හි ඉඩම් පරිහරණ ව්‍යාප්තිය........................................................31

වගු අංක 12 - උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ........................ 32

වගු අංක 13 -යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව........................................ 36

වගු අංක 14 -තම්මැන්නාව එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තව ................. 38

# 01.හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතීය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ " සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.


## 1.1. තම්මැන්නාව එල්ලංගාව හා එහි පිහිටීම

තම්මැන්නාව එල්ලංගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ පිහිටි අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටා ඇත. අඹන්පොල එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 60ක පමණ දුරින් පිහිටා ඇති අඹන්පොල ඓතිහාසික රාජධානියක් වන යාපහුවට නුදුරින් පිහිටා ඇත. පුරාවෘත වලට අනුව ඓතිහාසික වශයෙන් වැදගත්වන අනුරාධපුරය දක්වා ගමන් මාර්ගයේ අතරමග නවාතැන් පොලක් හෙවත් අම්බලමක් පිහිටි ස්ථානය පසුව අම්බලන්පොළ ලෙස ද ඉන් පසු තවදුරටත් ව්‍යවාහාරයේ දී අම්බලන්පොළ උච්චාරණ පහසුව උදෙසා අඹන්පොළ ලෙස හඳුන්වන ලද බවත් ලේකනවල සඳහන්වේ

.

තම්මැන්නාව එල්ලංගා අඹන්පොල සිට නිකවැරටිය දක්වා දිවෙන මාර්ගයට ආසන්නයේ අඹන්පොල සිට කි.මී. 04ක් පමණ නිකවැරටිය දෙසට වන්නට පිහිටා ඇත. කුඩා වැව, අංකිරිප්පුව වැව, පණාදරගම වැව, තම්මැන්නාව වැව, කලුපෙරුමාව වැව හා උඩ තම්මැන්නාව යන වැව් තම්මැන්නාව එල්ලංගාවට අයත්වේ. මෙම වැව් අතීතයේ ඉතා කුඩා ජල මූලාශ්‍ර පදනම් කරගත් පුද්ගලිකව ඉදිකරන ලද වැව් පද්ධතියකි. පසු කාලීනව අදියර කිහිපයකින් වත්මන් තත්වය දක්වා සංවර්ධණය වී ඇත. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග සියල්ල පැවති බවට ශේෂව පවතින ලක්ෂණ අනුව නිගමනය කල හැකිය. එහෙත් යුග යුග වශයෙන් කාලය ගෙවී යාම හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට හායනයට පත්ව ඇත. කට්ට කඩුව ගස් ගොම්මන පෝටා වැටිය පෙරහන ගොඩ වල යනාදී ඉතා වැදගත් අංගෝපාංග අද දක්නට නැත. මෙම හේතුවෙන් එල්ලංගාවේ වැව් ගොඩ වීම අද වන විට විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී.

## 1.2 තම්මැන්නාව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා




අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල කුඩා පරිමාණයේ වැව් රාශියක් පිහිටා ඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් සමූහයක් නියෝජනය කරයි. සුලු පරිමාණ වැව් 133ක් සම්බන්ධයෙන් එල්ලන්ගා පද්ධති 22ක් පමණ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංගා පද්ධතිය වැව් 27කින් සමන්විත පිදුරුවල්ලව එල්ලංගාව වන අතර තම්මැන්නාව එල්ලංගාව වැව් 06කින් යුක්ත වේ. මෙම එල්ලංගාව ආසන්නයෙන්ම පිහිටා ඇත්තේ අස්සැද්දුම එල්ලංගාවයි. මෙම එල්ලංගාව වැව් 02කින් යුක්ත වුවත් එහි වැව් 03 පිහිටා ඇත. සෙසු එල්ලංගා වල වැව් 1සිට 12 දක්වා පරාසයක විහිදී පවතී. ව්‍යාපෘතිය මගින් තෝරාගත් එල්ලංගා 15ක වැව් 69ක් පුණරුත්ථාපනය කර ඇත. එහෙත් මෙම එල්ලංගා නිරීක්ෂණය කරන විට තවත් ලොකු කුඩා වැව් රැසක් පිහිටා ඇත. එල්ලංගාව සැලකිල්ලා ගැනීමමේදී මෙම සියලු වැව් වල ජල ධාරිතාවය සලකා

බැලිය යුතුය. තවද දෙවන අදියර යටතේ මෙම එල්ලංගා වල තෝරාගත් වැව් 11ක් පුණරුත්ථාපනය කිරීමට නියමිතය. එල්ලංගා 15ක වැව් පුණරුත්ථාපනය කලද එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන යටතේ තෝරාගෙන ඇත්තේ වැව් 03ක් හා ඊට වැඩි සංඛාවක් වැව් පවතින්නාවූ එල්ලංගා පමණි. ඒ අනුව අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ පද්ධති 10ක් වන අතර මෙම එල්ලංගා බොහොමයක් කිනෙකට ආසන්නයේ පිහිටා ඇත .

## 1.3. තම්මැන්නාව එල්ලංගාව හා එහි පිහිටීම

තම්මැන්නාව එල්ලංගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ පිහිටි අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටා ඇත. අඹන්පොල එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ. කුරුණෑගල සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 60ක පමණ දුරින් පිහිටා ඇති අඹන්පොල ඓතිහාසික රාජධානියක් වන යාපහුවට නුදුරින් පිහිටා ඇත. පුරාවෘතවලට අනුව ඓතිහාසික වශයෙන් වැදගත්වන අනුරාධපුරය දක්වා ගමන් මාර්ගයේ අතරමග නවාතැන්පොලක් හෙවත් අම්බලමක් පිහිටි ස්ථානය පසුව අම්බලන්පොළ ලෙසද ඉන්පසු තව දුරටත් ව්‍යවහාරයේ දී අම්බලන්පොළ උච්චාරණ පහසුව උදෙසා අඹන්පොළ ලෙස හඳුන්වන ලද බවත් ලේකනවල සඳහන්වේ .

තම්මැන්නාව එල්ලංගාව පිහිටා ඇත්තේ අඹන්පොල සිට නිකවැරටිය දක්වා දිවෙන මාර්ගයට ආසන්නයේ අඹන්පොල සිට කි මී 04 ක් පමන නිකවැරටිය දෙසට වන්නටය. කුඩා වැව, අංකිරිප්පුව වැව, පණාදරගම වැව, තම්මැන්නාව වැව, කලුපෙරුමාව වැව හා උඩ තම්මැන්නාව යන වැව් තම්මැන්නාව එල්ලංගාවට අයත්වේ.මෙම වැව් අතීතයේ ඉතා කුඩා ජල මූලාශ්‍ර පදනම් කරගත් පුද්ගලිකව ඉදිකරන ලද වැව් පද්ධතියකි. පසු කාලීණව අදියර කිහිපයකින් වත්මන් තත්වය දක්වා සංවර්ධණය වී ඇත. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග සියල්ල පැවති බවට නටබුන් ඉතිරිව ඇත. එහෙත් ක්‍රමයෙන් යුගල වශයෙන් කාලය ගෙවීයාම හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට හායනයට පත්ව ඇත. කට්ට කඩුව ගස් ගොම්මන පෝටා වැටිය පෙරහන ගොඩ වල යනාදී ඉතා වැදගත් අංගෝපාංග අද දක්නට නැත. මෙම හේතුවෙන් එල්ලංගාවේ වැව් ගොඩවීම අද වන විට විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී.


පාංශු වයනය සහ අන්තර්ගතය මත පදනම්වන අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්රධාන පාංශු වර්ග තුනක් ඇත. මෙම පාංශු වර්ග වන්නේ;

අ) රතු පැහැයට හුරු දුඹුරු පස (RBE),


ආ) රතු පැහැයට හුරු දුඹුරු අඩු තෙතමනය සහිත ග්ලේ සහ

ඇ) අඩු හියුමික් ග්ලේ (LHG) පස,

ජල මාර්ග අවට පහත් බිම්වල සහ කුඹුරු වල දක්නට ලැබේ.




තම්මැන්නාව එල්ලංගාව තුල මෙම පාංශු වර්ග තුනම දක්නට ලැබේ. එල්ලංගාවේ සමස්ථ සිතියම හා දළ වශයෙන් සටහන් කර ඇති එල්ලංගාව ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ගොවින්ගේ පදිංචියෙන් ප්‍රදේශයම ආවරණය කරයි. ඒ අනුව ගෙවතු වගාව හා වෙනත් මානව අවශ්‍යතාවන් සදහා එල්ලංගාව යොදාගෙන ඇති බව පැහැදිලිව දක්නට ඇත. ම් අනුව මෙම එල්ලංගාව දැනටමත් ජනාකීර්ණ වී ඇති බවත් නිවාස හා වෙනත් ඉදිකිරීම් වලින් බහුල බවක් පෙන්වයි.




වගු අංක 01 - ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් එල්ලංගාව

| අංක | ග්‍රානි කොට්ඨාශයේ නම හා අංකය | ව්‍යාප්තිය හෙ | ජනගහනය | | | ප්‍රදේශය තුළ ගොවි සංවිධාන |
|---|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | |
| 01 | 172 නැකති කුඹුක් වැව | 305.75 | | | | |
| 02 | 173 පලාපත්වල | 688.10 | | | | |

වගු අංක 02 - ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් ගම්මාන

| **ග්‍රාම නි: වසම** | **අයත් වන ගම්මාන** |
|---|---|
| 172 නැකති කුඹුක්වැව | කුඹුක්වැව, දෙමටගොල්ල, පනාදරගම, පොතාන, බෙරුවැව, දුම්බුළුවාව |
| 173 පලාපත්වල | උඩතම්මැන්නැව, තම්මැන්නැව, කලුපෙරුමාව, පලාපත්වල, දෙමටැව, ඌරැව කුඹුක්ගැටේ |

ග්‍රාම  නිලධාරී කොට්ඨාශ මට්ටමින් අඹන්පොල ප්‍රා. ලේකම් කොට්ඨාශය



## 1.4. එල්ලංගාව පිළිබද සාමාන්‍ය තොරතුරු

වගු අංක 03 - එල්ලංගාව පිළිබද සාමාන්‍ය තොරතුරු

| තොරතුරු | විස්තරය |
|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අඹන්පොල |
| මැතිවරණ බල ප්‍රදේශය | යාපහුව |
| ගංගා ද්‍රෝණියේ නම | මී ඔය ගංගා දෝණිය |
| එල්ළංගාවේ නම | තම්මැන්නාව |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | අඹන්පොල |
| ග්‍රාම නිලධාරී වසම් | 2 |
| එල්ළංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්: | 984 |
| ජලපෝශක ප්‍රදේශයේ නම | |
| පැහැදිළි ජල පෝෂක සංඛ්‍යාව | |
| කෘෂිකාර්මික කටයුතු සදහා බාවිතා කරණ වැව් සංඛ්‍යාව | 7 |
| වනාන්තර ප්‍රදේශ | 00 |
| මුඩු බිම් | හෙක් 15 ( හදුනාගත් ) |
| එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව | |
| ගෙවතු | |

| | |
|---|---|
| පුණරුත්ථාපනයට යොමු කල වැව්සංඛාව | 4 |
| පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛාව | 3 |


## 1.5 තම්මැන්නාව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

තම්මැන්නාව එල්ලංගාව හෙක්ටයාර් 984කින් සමන්විතය වැව් 8 කින් යුක්ත වේ. මෙම වැව් 08 අතරින් වැව් 4ක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇති අතර තවත් වැව් 03ක් පුනරුත්ථාපනය කිරීමට නියමිතය. මෙම පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගාව අක්කර 820කි. මෙම වගා කටයුතු වල නිරතවන ගොවීන් සංඛ්‍යාව 162කි. එල්ලංගාව තුල සමස්ථ ජනගහනය 1340ක් පමනවේ. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මාණුෂික ක්‍රියාකාර කම් වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වන විනාශය හේන් හා ගොඩ ඉඩම් වගාව පාංශු ඛාදනය වැනි හේතුන් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම නි සා එල්ළංගාව බලවත් තර්ජනයකට මුහුණ දෙමින් සිටී. තවද මෙවන් ඉතා කුඩා එල්ලංගාවක් වීමත් ජනගහන වර්ධනය හා ඉඩම් බෙදී යාමත් පවතින සම්පත් වේගයෙන් භාවිතයට ගැනීමත් නිසා මෙම ප්‍රදේශවල වැව් ජලය සීග්‍රයෙන් සිදී යාමේ තර්ජනයකට මුහුණ දෙමින් ඇත. ජල මාර්ග සිදී යමින් දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමානවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර සංවර්ධනයකට භාජනය කිරීමයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කර තම්මැන්නාව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය තම්මැන්නාව එල්ලංගාව වෙත යොමු කර ඇත. එහිදී එල්ලංගා කලමනාකරණ කමිටුව මගින් එල්ලංගා පැතිකඩක් හා එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය.

## 1.6.එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි.එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්,"එල්ලන්" සහ "ගාව" යන්නයි.එල්ලන් යනු එල්ලෙන යන්නයි.ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

**එල්ලංගාවක ආකෘතියක්**




ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තුවේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විතවේ. ඒවා නම්

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- , ප්‍රාදේශීය ලේකම්වරු,
- ගොවි සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන,
- ජල සම්පත් මණ්ඩලය,
- ආපදා කලමණාකරන කාර්යාංශය,
- පොලිස් දෙපාර්තමේන්තුව,
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය,

- පරිසර අධිකාරිය,
- පෞද්ගලික අංශය,
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.



## 1.7. එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහ වැලි ව්‍යාපාරයහා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවයගනී. මෙම වැඩසටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාරවේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන (MIRP) හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් (ISMP ) ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එය ද ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වී මේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදුවේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක 1.6 දරණ ඡේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත . ඉතා වේගවත්ව හායනයට පත්වෙමින් තිබෙන ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.8. එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිළිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක්වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිළිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 1.9. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්මක්සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපායමාර්ගික මැදිහත්වීම්, ඒ සඳහාවන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වියයුතු පාර්ශවකාර ආයතනයන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවක රුවන් දැනුවත් කිරීම.

## 1.10. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හායනයට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල්වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදිව දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ.එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත්වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

# 02.එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

තම්මැන්නාව එල්ලංගාව පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය. එල්ලංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒතුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිදාන නියෝ ජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරනලදී. මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2024.04.30 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 4කින් යුක්ත විය. එල්ලංගාවේ හරස්කඩ චාරිකාව සැලසුම් කරණ ලද්දේ සරල රේඛාවක් හරහා ගමන් කිරීමෙන් නොව බහු අශ්‍රයක් තුල (Polygon) නිරීක්ෂණය කිරීමෙනි. බහු අශ්‍රයක් තුල ගමන් කිරීමෙන් වඩාත් පැහැදිලි දත්ත ලබා ගැනීමේ අපේක්ෂාවෙන් හා එම දත්ත යොදාගෙන ගුණාත්මක වාර්ථාවක් සකස්කර ගැනීම මෙහි අරමුණ විය. මෙහි සඳහා දත්ත සටහන් කරගැනීමට හැකියාව ඇති නිලධාරියකු ව්‍යාපෘතිය මගින් යොදා ගත් අතර මග පෙන්වීම සඳහා ගොවි සංවිධාන නියෝජිතයන් හා ගොවි ජන සංවර්ධන නිලධාරීන් කෘෂිකර්ම නිශ්පාදන සහකාර හා ග්‍රාම නිළධාරීන් මේ සඳහා සහබාගීවු සෙසු නිලධාරීන් වූහ.

1 කණ්ඩායම - පනාදරගම වැව හා ආශ්‍රිත ප්‍රදේශය.

2 කණ්ඩායම - කඩා වැව ආශ්‍රිත ප්‍රදේශය.

3 කණ්ඩායම - අංකිරිප්පව වැව හා ආශ්‍රිත ප්‍රදේශය.

4 කණ්ඩායම - තම්මැන්නාව වැව හා ආශ්‍රිත ප්‍රදේශය.

කණ්ඩායමේ ක්ෂේත්‍ර වැඩසටහන

කණ්ඩායම 04ක් මෙම චාරිකාවට සහබාගීවිය. සැලසුම් කල බහුඅශ්‍ර (Polygon) අනුව ක්ෂේත්‍රයේ නිරීක්ෂණ කටයුතු සඳහා මෙම කණ්ඩායම් යොදා ගන්නාලදී. මෙම සැලැස්ම අනුව තම්මැන්නාව එල්ලංගා පද්ධති චාරිකාව කිලෝ මීටර් 13කින් පමණ යුක්ත විය.
මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටු සාමාජිකයින්ට ඉදිරිපත් කර එම දත්ත වල නිවැදි තාවය තහවරු කර ගැනීම කරගන්නා ලදී. ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නා ලදී. චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශවවල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරුවල නිරවද්‍යතාවය

තවදුරටත් තහවුරු කරගැනීම අවස්ථා දෙකකදී කරනු ලැබීය. විශේෂයෙන් ම මෙම තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත්වේ. තවද එල්ලංගාව පිළිබඳව අධ්‍යනය කරනු ලබන ආයතන හෝ ව්‍යාපෘති වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා තොරතුරු ලබාගැනීමේ දී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධනය සැලසුම් කිරීමේදී මෙම තොරතුරු බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 03. තම්මැන්නාව එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

### 3.1. තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, තම්මැන්නාව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධවිය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිළිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනුලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේශනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍යවේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්යමණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනලදී.

(i) රැස්වීම් පැවැත්වීමට

(ii) ද්විතීය දත්ත එකතු කිරීම

(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම

(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසදීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x) එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කමනාකරන සැලැස්මට ඇතුලත් කර ඇත.

## 3. 2 තම්මැන්නාව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

තම්මැන්නාව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමනාකරණ සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කලමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා

පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ.ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම් 1. භූගෝල විද්‍යාත්මක 2. භූ විද්‍යාත්මක 3. ජලවිද්‍යාත්මක 4. පාරිසරික විද්‍යාත්මක 5. මානව හැසිරීම් 6. සමාජ ආර්ථික 7. කෘෂිකාර්මික 8. වාරිමාර්ග කලමණාකරන 9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි. මේවා එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලාංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 3.3.තම්මැන්නාව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

### 3.3.1. භූගෝලීය (Geographical ) තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, දකුණින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 136.96වේ. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමිය ම තැනිතලා ස්වරූපයක් ගනී.උපරිම උන්නතාංශය අඩි 315ක් වන අතර එය දකුණු මායිමට ආසන්නව පිහිටා ඇත. අවම උන්නතාංශය අඩි 212ක් පමණ වන අතර එය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ පිහිටා ඇත.

තම්මැන්නිව එල්ලංගාව තරමක් කුඩා එල්ලංගාවකි. එහි වැව් 6 ක් පිහිටා ඇති අතර එල්ලංගාව නැගෙනහිර සිට බටහිර දෙසට කි.මී. 6ක් පමණ දක්වා විහිදී යයි. විශේෂිත උස් කඳු වැටි ප්‍රදේශය තුල

දක්නට නොමැකි අතර ප්‍රදේශයේ පවතින උන්නතාංශය අනව එල්ලංගාවට ලැබෙන වර්ෂාවෙන් වැව් පෝෂණය වේ. ස්වාභාවික වනාන්තර දක්නට නැත. එල්ලංගාව තුල ගෙවතු වගාව හා නිවාස කෘෂිකාර්මික ඉඩම් පිහිටා ඇත. මෙම භූ විශමතාවය අනුව ලැබෙන වර්ෂාපතනය වේගවත්ව වැව් තුලට ගලා යයි. ප්‍රදේෂයේ පවතින්නේ රැලි සහිත භූමියකි. මෙම භූ විශමතාවය අනුව ලැබෙන වර්ෂාපතනය වැව් වලට එක්වනවා හැර විශේශිත ජල මාර්ග හෝ ඇලවල් නැත. තම්මැන්නාව එල්ලංගාව මෙන්ම ප්‍රදේශයේ සෙසු එල්ලංගා වලින් පිටතට ගලායන ජලය ඉගිනිමිටිය ජලාශයට රැස්වේ.

## 3.3.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව හෙක්ටයාර් 984කින් යුක්තය. මෙම ප්‍රදේශය ඉතා කුඩා වැව් කිහිපයකින් යුත් එල්ලංගාවකි. ජනාවාසයක් අතර ලදු කැලෑව මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. අඹන්පොල ප්‍රා. ලේකම් කොට්ඨාශයේ භූමි ප්‍රදේශය සාමාන්‍යයෙන් මෘදු බෑවුමක් සහිත රැලි පැතලිවේ. ජලාපවාහන රටාව ප්‍රධාන වශයෙන් මීඔය ගංගා ද්‍රෝණිය හා සම්බන්ධවන අතර එය හිතෝ-ඇල සහ අඹගම්මන ඇල ප්‍රධාන ජල මූලාශ්‍රවේ. අඹන්පොළ ප්‍රදේශයට දකුණු දෙසට පතිතවන වැසි ජලය දකුණු ප්‍රදේශයට ගලා බසින අතර එය මී ඔයට එකතුවේ. අඹන්පොල ප්‍රා.ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජල මාර්ග බොහෝ ස්ථානවල අවහිරකර ඇති අතර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩා වැව් රාශියක් ඉදිකර ඇත.
වැසි සමයේ දී, ජලය වේගයෙන් කාන්දුවීම නිසා දැඩි පාංශු ඛාදනයක් සිදුවේ. මෙම ප්‍රා. ලේකම් කොට්ඨාශය තුළ ඇති මුළු කුඩාවැව් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් අතහැර දමා ඇත. වියළි කාලවල දී භූගත ජල මට්ටම අඩි 30ක් පමණ ගැඹුරට දක්නට ලැබෙන අතර දැනට ඇතැම් ගම්මානවල කෘෂි ළිං සහ නළ ළිං හරහා මෙම ජලය ලබාගනී. වර්ෂාවෙන් ලැබෙන ජලය කාලීන ජල මාර්ග ඔස්සේ ගලා ගොස් සුලු



කාලයකින් සිදීයයි. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලයද ඉතා කෙටි වන්නේ ජලය රඳවා ගැනීමට වැව් ඉස්මත්තේ නිසි පෝෂිත ප්‍රදේශයක් නොමැති හෙයිනි. ගොවීන් වී වගාව හරුණු විට ගොඩ බෝග වගාවේ නිරතව ඇත . වැව් ආසන්නයේ හේන් වගාව දක්නට ඇතත් මෙවායේ වගාව මහ කන්නයට පමණක් සීමාවේ. මෙම වගාවේ අස්වැන්න නෙලන තුරු සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට ගොවීන්ට සිදුවී ඇත. විශේෂයෙන් වන අලි හානිය උග්‍රවන අතර එය කළමනාකරණය කර ගත නොහැකිය . ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත පවා අනතුරට පත්වෙමින් ඇත.

### 3.3.3. පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගාව තුල වැව් 7ක් පවතින අතර මෙම වැව් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනී. රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ප්‍රදේශය තුල ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත.



බොහොමයක් වැවවල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලේ පිහිටි කුඹුරු යායෙනි. මෙම වැව් තාවුල්ලේ වැව හා බැදුණු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත. වාර්ෂිකව වැව් ඉස්මත්තෙ කුඹුරු වගාව නිසා සේදී පහලින් පිහිටි වැවට එකතු වන රොන්මඩ හා පස් හා වැලි අංශු අති විශාලය. මෙහි ඉස්වැටිය පෙරණය ගොඩවල අක්‍රීය වී ඇත. එයට ප්‍රධාන හේතුව වන්නේ වැව් ඉස්මත්ත මුලුමනින්ම අනවසර අල්ලා ගැනීම් වලට ලක් වීමනිසාය. වැව ඇතුලත පැහැදිලිව අනවසර කුඹුරු දක්නට ලැබේ. මෙම අනවසර ඉඩම් වලට තාවකාලික අනවසර බලපත්‍ර පවා නිතුත්කර ඇත. වැව ඉස්මත්ත පදි'චිය සඳහා භාවිතා කිරීමත් නොයෙකුත් අක්‍රමිකතා සඳහා භාවිතා කරමින් වැව ගොඩකරන ගොවීන් ඇත. උදාහරණ පනාදරගම වැව ඉසමත්තේ පදිංචිකරු වැව ගොඩකර විශාල හානියක් කර ඇත.



මෙම තොරතුරු පරීක්ෂාවේදී හා කේෂත්‍ර පරීක්ෂාවලදී දක්නට හා සහබාගී වූ ගොවීන්ගෙන් ලැබුණු තොරතුරු අනුව වැව් ඉස්මත්තේ වැව තුලට පැමින අක්කරගනන් අල්ලාගෙන වගා කරන අනවසර කරුවන් සංවිධානාත්මකව හා උපාය ශීලීව වාන පහත් කර ගැනීමට කටයුතු කිරීමයි.දේශපාලන බලපෑම් මත හා නිලධාරීන් ගෙන් ලැබෙන ආවරනය ප්‍රබල බලපෑමයි. නිසි අධීක්ෂනයක් නොකිරීමත්ය. දේශගණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ මෙම වැව් පද්ධති පුණරුත්ථාපනය කලද වර්ථමානය වන විට වැව් හා අදාල පද්ධතිය සම්පර්ණණයෙන්ම වල්බිහිවී ඇත. ඊට අදාල වැව් මානා ඉලුක් හා වෙනත් කැලෑවට යටවී ඇත මුලු පරිසර පද්ධතියම මේ නිසා වල් බිහිවී ඇති අතර වන අලින්ට මෙය කදිම තෝතැන්නකි. වාරිමාර්ග පරිසර පද්ධතිය නඩත්තු කරගැනීමට ගොවි සංවිධාන වලට අවශ්‍ය තාවයක් හෝ හැකියාවක් නොමැති බව මෙයින් පෙනේ. විශාල වියදමක් දරමින් කර ඇති අලුත්වැඩියාවන් ඉතා කෙටි කලකින් විනාශ වී යාහැකිය.



ගම තුල නිරන්තරයෙන් ගොඩනැගිලි ඉදිවෙමින් පවතී වෘක්ෂලතා ආවරණය පවතින්නේ 15% පමණ වේ. වන සංරක්ණ දෙපාර්තමේන්තුවට අයත්වන සංරක්ෂණ කලාප නැත. මෙම එල්ලංගාව තුල මීට වසර 03කට පෙර පැවති මුලු ජනගහනය 927ක් පමණ විය. ක්‍රමයෙන් සිදුවන මෙම ජනගහන වර්ධනයත් සමග මෙම එල්ලංගාව තුල තවතවත් වෙනස් භූමි දර්ශනයන් ඇති විය හැකිය. බොහෝ ඉඩම් එලිපෙහෙලි කිරීමත් සමග තම්මැන්නාව එල්ලංගාව අක්‍රීය වනුඇත. වැව් ජලය මුළුමනින්ම සිදීයාහැකිය. මෙම තත්වය පාලනය කර ගැනීමට එල්ලංගා කළමනාකරණ කමිටුවටත් ගොවීන් හා අනෙකුත් ප්‍රතිලාභීන්ගේත් හවුල්කාර ආයතන වල සහයෝගය අත්‍යාවශ්‍ය වේ. සතුන්ගෙන් සිදුවන හානිය (රිළවුන් අලින් හා ඌරන්) ඉතා විශාලය. මේ නිසාම ගොවීන් වෘක්ෂ ලතා සිටුවීම හා පවතින වන සම්පත සම්බන්ධයෙන් දක්වන්නේ අකමැත්තකි.

## 3.3.4. එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුළ වැව් 8ක් පමණ ඇත. මේ අතුරෙන් වැව් 6ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇත. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක්



වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. සෑම වගා ඉඩමකම ගස් උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත. වගාබිම් හා බොහෝ අවදානම් ස්ථාන වල අලිවැට ඉදිකර ඇතත් මේවා විධිමත්ව ඉදිකරන ලද වැටවල් නොවේ. එල්ලංගාව මුලුමනින්ම පාහේ ජනාවාස වලින් යුක්ත වන හෙයින් නිරන්තරයෙන් නිවාස ඉදිකරමින් හා වැඩිදියුණු කිරීම් පවතී. තවද ඉඩම් කැබලිවීමද වේගවත්ය. ගොඩ ඉඩම් වල සිදුවන පාංශු තට්ටුව කැපීම ළිං කැපීම හා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂෙයන් මහ කන්නයේ හා හදිසියේ ඇතිවන අධික සංවහන වර්ෂාව සිදවන අවස්ථා වලදී වේගවත් ව ජලය ගලා යාමත් සමග පාංශු ඛාදනය වේගවත්වේ. මෙම ඛාදනයත් සමග රොන්මඩ හා පාංශු කොටස් වැව් වල තැම්පත්වීම වැලැක්විය නොහැකිය. අවිධිමත් සත්ව

වගාබිම් ව්‍යාප්තිය එල්ලංගාව තුල දක්නට ඇත. වැව් ඉස්මත්තේ හේන්වගාව ද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයක්වේ. මෙහිදී විධිමත් පාංශු සංරකෂණ ක්‍රම අනුගමනය කලයුතුය.

කොන්ත්‍රාත් කරුවන්ගේ අවිචාරමත් ක්‍රම එල්ලංගාවට ඉතාදැඩි බලපෑමක් එල්ල කර ඇති බව ගොවීහු පවසති. පුණරුත්ථාපන කටයුතු සමග ගමට ගිය කොන්ත්‍රාත් කරුවන් හා හිතවත්කම් හෝ සේවා සපයමින් අනවසර හෝ වෙනත් රක්ෂිත ඉඩම් තහවුරු නර ගැනීමේ අපේක්ෂාවෙන් සිටි කූට පුද්ගලයන් හා එක්ව වැව් වාන් පහත් කරගැනීමට හෝ වැවේ රොන්මඩ වැව් රක්ෂිතයට ගොඩ දමා ගැනීම වැනි නීති විරෝධී ක්‍රියාවන් වල යෙදී ඇත.

## 3.3.5. තම්මැන්නාව එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 8කි. වැව් 4ක පුනරුත්ථපන කටයුතු 90% අවසන්ය. මීට අමතරව තවත් වැව් 03 පුණරුත්ථාපනය කිරීමට සැලසම් සකස් කරමින් පවතී. මින් වැව් 03ක් අතීතයේ ඔලගම් වැව් වශයෙන්. පවතින්නට ඇති බවට හදුනාගත හැකි ය. මෙම වැව් යටතේ ඇති කුඹුරු සුලු වශයෙන් වගා කරන්නේ ඊට යාබද වැව් වල ජලය උපයෝගි කරගෙනයි. මෙම වැව් බෙහොමයක් ඉතා කුඩා වන අතර අක් 02 සිට 10 දක්වා පරාසයකින් යුක්තව වගා බිම් පවතී. එහෙත් එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබඳව වැදගත් කමක් ඇත. විශේෂයෙන්ම සුලු ගොවින් සංඛ්‍යාවක් මෙම වැව් වල සිටින නිසා ජල කළමනාකරනය ඉතා පහසුය. එහෙත් මෙම වැව් වල නඩත්තුව ඉතා දුර්වල බව සඳහන් කලයුතුය. ඇලවේලි හා වැව් බැම්මේ නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදුනොවේ. මෙයට හේතුව වන්නේ වැව යටතේ ඉතා සුලු ගොවීන් සංඛ්‍යාවක් සිටීම හා සුලු කුඹුරු ප්‍රමාණයක් පැවතීමත්ය. තවද මෙම වැව් වල ගබඩා වනනේ ඉතා අඩු ජලධාරිතාවයකි. මේ නිසාම වැවේ ජලය ඉක්මනින් සිදීයයි. එක් ගොවි සංවිධානයකට වැව් කිහිපයක් කළමනාකරණය කිරීමට සිදුවී ඇත. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වය සෘජුවම බලපාන ලබයි. (රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්තිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත බොහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවෙනි. තාවුල්ලද අස්වද්දා ඇත. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත.) ගස් ගොම්මන, පෙරණ, ගොඩ වල, කට්ටකඩුව නැත. ජල පාලකවරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්නරැ ස්වීමේදීය. ඇතැම් ජලපාලකයන් එකදිගට ම වසරකිහිප පත්වේ. ඒ ගොවීන්ගේ කැමැත්තෙනි. පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන බව සඳහන් වුවත් එය එසේ සිදුනොවේ. නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුව අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත සලාරිස් ලැබියයුතු

වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්භහ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ වගා කෙරේ. මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. වාරිමාර්ග පද්ධතිය පුන්රුත්ථාපනයෙන් පසුව විධිමත් නඩත්තු සැලැස්මක් අනුව ක්‍රියාවට නැංවිය යුතුය. ගොවි සංවිධානයේ අරමුදල ප්‍රමාණවත් නොවේ. වැව් යටතේ කුඹුරු සුළු ප්‍රමාණයක් පැවතීම නඩත්තුව දුර්වල වීමට හේතුවේ. වැවේ මූලික නඩත්තු යටතේ වැවේ වැව් බැම්ම, වාණ, සොරොව් දොර ග්‍රීස් කිරීම, යන අංග ඉතාමත් වැදගත්ය. ඇල පද්දතිය හා ඊට අයත් නිර්මිත නියමිත කාලයට අනුව නඩත්තුව කල යුතුය. මෙම ක්‍රියාකාරකම් පිළිබඳව ගොවි සංවිධානයේ සියලු ගොවි සාමාජිකන් දැනුවත් කලයුතුය. එමෙන්ම නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු වේ. මෙම ක්‍රියාවලිය මුළුමනින්ම දුර්වල වී ඇත.

වගු අංක - 04 පුණරුත්ථාපනය කල හා නොකල වැව්

| අංක | වැවේ නම | ගොවීන් සංඛ්‍යාව | අක්කර | පුණරුත්ථාපනය |
|---|---|---|---|---|
| 01 | අංකිරිප්පුව වැව | 2 | 3 | පුණරුත්ථාපනය කලා |
| 02 | කුඩාවැව | 14 | 21 | පුණරුත්ථාපනය කලා |
| 03 | පණාදරගම වැව | 24 | 32 | පුණරුත්ථාපනය කලා |
| 04 | තම්මැන්නාව වැව | 56 | 42 | පුණරුත්ථාපනය කලා |
| 05 | උඩ තම්මැන්නාව වැව | 18 | 11 | පුණරුත්ථාපනය නැත |
| 06 | කලුපෙරුමාව වැව | 21 | 13 | පුණරුත්ථාපනය නැත |
| 07 | බෙරු වැව | 3 | 4 | පුණරුත්ථාපනය නැත |
| 08 | දිසානායකගේ කොටු වැව | 1 | 2 | පුණරුත්ථාපනයනැත |

මූලාශ්‍රය ගොවි ජන සං. දෙ .නවගත්තේගම

මහ කන්නයේදී අඛණ්ඩව වගාවන් සිදු නොවන අතර සමහර වැව් වල කන්න ගණනාවක් මහ කන්නයේදී පවා වගා කර නොමැත. කැලෑව තුල පිහිටි ඔලගම් වැව් යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් ඇතත් ඒවා වගා නොකෙරේ. එයට හේතුව නම් සතුන්ගෙන් වන හානි පාලනය කර ගැනීමේ ඇති දුශ්කරතාවයයි.

වගු අංක 05 - ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය

| | Average Monthly Rainfall (mm) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Month | Anamaduwa Dispensary | Atharagalla | Dewahuwa | Giribawa | Inginimitiya | Karandipooval | Kottukachchiya | Maha Uswewa | Mahagalkadawala | Mediyawa Tank | Puttalam | Siyambalangamuwa | Tabbowa Irrigation |
| Jan | 46 | 48 | 124 | 49 | 68 | 44 | 36 | 44 | 72 | 85 | 49 | 58 | 49 |
| Feb | 35 | 30 | 96 | 35 | 46 | 40 | 32 | 34 | 49 | 52 | 40 | 51 | 35 |
| Mar | 84 | 61 | 73 | 45 | 64 | 57 | 83 | 61 | 72 | 104 | 54 | 50 | 70 |
| Apr | 176 | 153 | 176 | 123 | 196 | 120 | 167 | 151 | 199 | 214 | 136 | 152 | 151 |
| May | 122 | 82 | 85 | 70 | 79 | 91 | 114 | 86 | 86 | 105 | 94 | 65 | 106 |
| Jun | 47 | 17 | 29 | 13 | 19 | 25 | 47 | 18 | 17 | 39 | 27 | 12 | 34 |
| Jul | 21 | 9 | 21 | 8 | 18 | 13 | 25 | 10 | 20 | 22 | 10 | 16 | 17 |
| Aug | 35 | 27 | 27 | 21 | 29 | 15 | 33 | 26 | 35 | 37 | 20 | 26 | 30 |
| Sep | 71 | 56 | 64 | 57 | 74 | 57 | 60 | 52 | 84 | 77 | 68 | 62 | 62 |
| Oct | 269 | 233 | 280 | 192 | 233 | 227 | 262 | 221 | 239 | 297 | 241 | 227 | 234 |
| Nov | 225 | 235 | 288 | 174 | 225 | 219 | 238 | 225 | 241 | 265 | 238 | 231 | 202 |
| Dec | 129 | 140 | 258 | 122 | 158 | 131 | 118 | 138 | 165 | 176 | 136 | 142 | 116 |


ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ඉහත වගුව තුලින් දක්වා ඇත. මෙම සටහන් අනුව එල්ලංගාව ආසන්නයේම ගිරිබාව අතරගල්ල හා ඉගිනිමිටිය වැසි මාන තොරතුරු අනුව ඉතා අවම වර්ෂාපතනයක් මෙම වසර තුල දක්කවා ඇත. දැනට එල්ලංගාවේ පිහිටි සෑම වැවකම ජලය බෙදා දීම මුර ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර ඒ අනුව එක් එක් ගොවියාට පැය කිහිපයක් පමණක් ජලය ලබාදේ. එහෙත් ඇතැම් ගොවීන් තම අභිමතයට අනුව ජලය ලබා ගැනීම නිසා විධිමත් ජල පාලනයක් සිදු නොවේ. සියලුම වැව්වල වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාකාරිත්වය දක්නට ලැබෙන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත. විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් නඩත්තුවක්වේ. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරින්ගේ මතය වී ඇත. ඇල පද්ධතිය ඉතා අබලන්ය. මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය ඇතැම් ඇලමාර්ග කුණු ඇලට ජලය හරවා කුණු ඇල පුරවා කුඹුරු වලට ජලය හරවා ගැනීමට ගොවීන් කටයුතු කරයි. ඒ අනුව ජල කළමනාකරණයක් පිළිබඳව කථා කිරීමට පෙර පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කලයුතුය.

## 3.3.6.සමාජ ආර්ථික තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරාණ යාපහුව රාජධානියට ආසන්නව පිහිටා ඇති අතර ඓතිහාසික සාධක මත අනුරාධපුර යුගයේ දී මෙම ප්‍රදේශයේ ජනාවාස ආරම්භ වූ බව සැලකේ. පීල්ල රාජකීය විහාරය, වෙහෙරලන්දයාය, සඳුන්ගිරි රාජකීය විහාරය, ඇඹුල්ගිරි රාජකීය විහාරය, ගනේගම රාජකීය විහාරය සහ ගවරතිස්සරාමය දේවාලය ඇතුළු පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන රාශියක් තම්මැන්නාව ආසන්නයෙන්යෙන්ම පිහිටා ඇත .

අනුරාධපුර සහ කුරුණෑගල යන ප්ධාන නගර දෙකක් අතර මධ්‍යම ස්ථානය වූ බැවින් පුරාණයේ සංචාරකයින්/ වෙළෙන්දන් සඳහා විවේක ස්ථානයක් වන අම්බලම -( වර්තමාන බස් නැවතුම්පොළ) පිහිටියේ අඹන්පොල නගරයේය. මේ අනුව අඹන්පොළ යන වර්තමාන ස්ථානනාමය 'අම්බලන්පොළ' යන්නෙන් ව්‍යුත්පන්න වී ඇතිබව පැරණි මුතුන් මිත්තන්ගේ සාක්ෂි වල සඳහන් වේ. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 1988 දී මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප කාර්යාලයක් ලෙස ආරම්භ කරන ලද අතර 2000 වර්ෂයේදී නව ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් විවෘත කිරීමත් සමඟ පූර්ණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ක්‍රියාත්මක විය. ගොවිජන සේවා කටයුතු සඳහා අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය ක්‍රියාත්මකවේ. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වැව් 28ක් සහ අඹන්පොළවැව සහ මැඩියාව යන ප්‍රධාන මහා වාරි මාර්ග යෝජනා ක්‍රම දෙකක් සහ සුළු වාරි වැව් 283ක් ඇත.


එල්ලංගාව තුල ජීවත්වන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 972කි. පවුල් වශයෙන් 162කි. මෙම ජනගහනයෙන් 85% කෘෂිකර්මාන්තය හා ආශ්‍රිත ඊකියාවන්හි නිරතවේ. පහත ප්‍රස්ථාරයෙන් ඒ ඒ එල්ලංගා අනුව ප්‍රතිලාභී ව්‍යාප්තිය පැහැදිලි කරයි. මේ අනුව තම්මැන්නාව එල්ලංගාවේ හා ඒ ආශ්‍රිත කලාපයේ සැලකියයුතු ජනගහනයක් වාසය කරයි.




| ආදායම් පන්තිය | පවුලේ ගණන |
|---|---|
| 1000 -8000 | 344 |
| 8001- 15000 | 595 |
| 15001 -20000 | 688 |
| 20001- 25000 | 971 |
| 25001- 30000 | 378 |
| 300000< | 155 |
| Total | 3131 |

PRA - CSIAP

PRA - CSIAP




අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයම ආවරණය වන පරිදි ආධායම් මට්ටම සලකා බැලීමේදී (ඉහත වගු සටහන හා ප්‍රස්ථාරය සැලකිල්ලට ගැනීමේ දී) තම්මැන්නාව එල්ලංගාව හා ඊට අදාල ප්‍රජාවගේ ආධායම් මට්ටම සැලකිල්ලට ගත යුතුය. ජනගහනයෙන් 31% කගේ ආදායම 20001- 250000කි. ජනගහනයෙන් 22%කගේ ආදායම වන්නේ 150001 -20 000 අතරවේ. මේ අනුව ජනගහනයෙන් හරි අඩකට වැඩි ප්‍රමාණයක ඇත්තේ 150001 – 25000 අතර ආදායමකි. 300000 වැඩි ආදායමක් ලබන්නේ 5% ප්‍රමාණයකි.

## 3.3.7.ප්‍රදේශයේ වී නිෂ්පාදනය

වගු අංක 06 - එල්ලංගාවට අයත් ප්‍රදේශයේ වී නිෂ්පාදනය


| අංක | එල්ලංගාව | මහ ඉඩම් | යල ඉඩම් | මහ Mt | යල Mt |
|---|---|---|---|---|---|
| 1 | කට්ටපුව | 111 | 45 | 301 | 120 |
| 2 | දටව මහ වැව | 68 | 27 | 184 | 73 |
| 3 | තම්මනනාව | 50 | 20 | 134 | 53 |

PRA - CSIAP

කෘෂිකර්මාන්තය ප්‍රධාන කොට ගත් ආදායම ඉහත වගු සටහනින් දක්වයි. තම්මැන්නාවේ මහ කන්නයේ අක් 50ක් වගාකර ලබාගන්නා ආදායයයම මෙ ටො 134 කි. මෙලෙස යල කන්නයේදී එල්ලංගාව තුල වී අස්වැන්න හෙක් 20කට මෙ ටො 53 දක්වා පහල බසී. මෙම තත්වය සලකා බැලීමේදී වාර්ෂික ආදායම මෙලෙස හැසිරීම සාධාරණ විය හැකිය. මේ අනුව ගොවීන්ගේ වාර්ශික ආදායම අඩුවීමට හේතුවේ. තවද පහත සදහන් වගුව අනුව තම්මැන්නාව එල්ලංගාවේ බඩඉරිගු වගාවේ අස්වැන්න හා වගා තත්වයන් දක්වා

ඇත. මේ අනුව හෙන් 10 -12 දක්වා වන වාර්ශික වගාවේ අස්වැන්න මෙ ටො 30 -37 දක්වා අගයක් ගනී. වෙනත් ආදායම් මාර්ග පවතින්නේ ඉතා සුලු වශයෙනි.

එල්ලංගාව තුල ජීවත්වන ශ්‍රමිකයන් 10% පමණ කම්කරුවන් වශයෙන් ප්‍රදේශයේ ම හා තදාසන්න තඹුත්තේගම ගල්ගමුව හා අඹන්පොල නගරවලට අළවි කරන තොග වෙලෙන්දන් කිහිප දෙනෙකු ද එල්ලංගානව තුල ව්‍යාපාර කටයුතු වල නිරතව සිටී.




PRA - CSIAP

වගු අංක 07 - මුළු එල්ලංගා පදනම වැඩිකිරීමේ පුරෝකථනය HSAADP ව්‍යාපෘතියෙන් පසු වී නිෂ්පාදනය

| අංක | එල්ලංගාව | පවතින වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් | | HSAADP පසු නිෂ්පාදන පුරෝකථනය | |
|---|---|---|---|---|---|
| | | මහ Mt | යල Mt | මහ Mt | යල Mt |
| 1 | කට්ටපුව | 301 | 120 | 361 | 216 |
| 2 | දටව මහ වැව | 184 | 73 | 221 | 131 |
| 3 | තම්මනනාව | 134 | 53 | 161 | 95 |
| 4 | පිදුරුවල්ලව වැව | 512 | 205 | 614 | 369 |

වගු අංක 08 - Abeanpole Hotspot එල්ලංගා පදනම දැනට පවතින බඩ ඉරිඟු වගා තත්ත්වය

| අංක | එල්ලංගාව | මහා ඉඩම් දිගුව | නිෂ්පාදනය Mt | යල ඉඩම් දිගුව | නිෂ්පාදනය Mt |
|---|---|---|---|---|---|
| 1 | කට්ටපුව | 22 | 67 | 28 | 84 |
| 2 | දටව මහ වැව | 14 | 41 | 17 | 51 |
| 3 | තම්මන්නාව | 10 | 30 | 12 | 37 |
| 4 | පිදුරුවල්ලව වැව | 38 | 114 | 47 | 142 |

PRA - CSIAP

වගු අංක 09 - Abanpola Hotspot එල්ලංගා පදනම පවතින වාර්ෂික රටකජු නිෂ්පාදන තත්ත්වය

| අංකය | එල්ලංගාව | යල ඉඩම් දිගුව | වාර්ෂික නිෂ්පාදනය Mt |
|---|---|---|---|
| 1 | කට්ටපුව | 33 | 57 |
| 2 | දටව මහ වැව | 20 | 35 |
| 3 | තම්මන්නාව | 15 | 25 |
| 4 | පිදුරුවල්ලව වැව | 57 | 97 |

PRA - CSIAP

ඉහත වගු අංක 7-9 දක්වා වගු වලින් ප්‍රදේශයේ භෝග වගා රටාව අනුව අදායම් තත්ත්වය පිළබඳව යම් නිගමනයක් කල හැකිය. කෘෂිකාර්මික කටයුතු වලින් ලබන අදායම හා වගා කරන භූමි ප්‍රමාණය ඉතා අඩුය. මෙයට හේතුව ව්‍යාප්තිය හා පුහුණුවීම් වගාවට ගොවීන් යොමුකරගෙනීමේ පවතින දුර්වලතාවන්ය.

### 3.3.8. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව


ප්‍රදේශයේ කෘෂිකාර්මික බෝග රටාව ලෙස මහ කන්නය වැසි ජලය උපයෝගී කරගෙන ද යල කන්න වැව් හා කෘෂි ළිංවල ජලය කළමනාකරනය කරමින් ද සිදු කරයි. යල කන්නයේ දී ද වී වගාව බහුලව සිදු කරන අතර හේන් වගාවද සිදු කරයි. නමුත් යල කන්නයේ දී අංකිරිප්පුව හා පනාදරගම වැව් ආශ්‍රිතව යල කන්නයේ බෙත්ම ක්‍රමයට වගා කටයුතු සිදු කරන අතර බොහෝ විට අතිරේක බෝග වගාව සිදු කරයි.

වගු අංක 10- Abanpola Selicted එල්ලංගා පාදක භූමි භාවිත පැතිකඩ

| අනු අංකය | එල්ලංගාව | වැව් ප්‍රමාණය | ආවරණය කරන ලද වැවේ ප්‍රදේශය (හෙක්ටයාර) | කෘෂි ඉඩම් වර්ගය (හෙක්ටයාර) | |
|---|---|---|---|---|---|
| | | | | අඩු | ඉහළ |
| 1 | කට්ටපුව | 12 | 111 | 162 | 173 |
| 2 | දට මහ වැව | 5 | 68 | 99 | 105 |
| 3 | තම්මැන්නාව | 8 | 50 | 72 | 77 |
| 4 | පිදුරුවල්ලව වැව | 27 | 190 | 275 | 294 |

PRA - CSIAP

එල්ලංගාවට අයත් මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 149ක් ගොඩ හා මඩ ඉඩම් ලෙස වගා කටයුතු කරනු ලබයි. මෙයින් මහ කන්නයේ දී හෙක්ටයාර 50ක් හා යල කන්නයේ දී හෙක්ටයාර 20ක් ලෙස වී වගා කරන අතර එයින් මහ කන්නයේ දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 134ක් ද යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 53ක් ද වේ. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් වැව් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම නිෂ්පාදනය මහ කන්නයේ දී මෙට්‍රික් ටොන් 161ක් ද යල කන්නයේ දී මෙට්‍රික් ටොන් 95ක් ද ලෙස ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ. (PRA- CSIAP වර්ථාවට අනුව)




අතිරේක බෝග ලෙස බඩ ඉරිඟු, රට කජු, ලොකු ළූණු, මුං හා පළතුරු ලෙස කෙසෙල්, පැණි කොමඩු අදිය දවගා කරයි. ඊට අමතරව පොල් හා තේක්ක දැව වගාව ද ප්‍රෙද්ශය පුරා දක්නට ලැබේ. දැව ලෙස තේක්ක අළවියෙන් යම් ආදායමක් ලබාගනී. තම්මැන්නාව එල්ලංගාව යටතේ බඩ ඉරිඟු නිෂ්පාදිත බිම් යල සහ මහ ලෙස පිළිවෙළින් හෙක්ටයාර 10 සහ 12 ලෙසද බඩ ඉරිඟු නිෂ්පාදනය මහ සහ යල පිළිවෙලින් මෙට්‍රික් ටොන් 30 හා 37 ලෙසද හඳුනා ගැනේ. මීට අමතරව යල කන්නයේ දී රටකජු වගා කරන අතර එය හෙක්ටයාර 15ක් තුල මෙට්‍රික් ටොන් 35ක් වේ. මෙම වගාවට ගොවීන් වැඩිපුර නැඹුරු කරගැනීමේ හැකියාවක් පවතී. පැනිකොමඩු නිෂ්පාදනය ද සැලකිය යුතු මට්ටමකින් සිදු කරන අතර හෙක්ටයාර 4කින් මෙට්‍රික් ටොන් 28 ක් පමන නිෂ්පාදනය කරනු ලබයි. මීට අමතරව අක්කර 37කට වඩා වැඩි ප්‍රෙද්ශයක පොල්වගාවද දක්නට ලැබේ. විශේෂයෙන් වැව් ආශ්‍රිතව පොල්වගාව බහුලව දැකගත හැකිය. ඉන් 40%ක් පමණ එල නොදරන පැලපොල් වගාව ලෙස පවතී. වන

අලින්ගෙන් අති විශාල හානියක් පොල් වගාවට සිදුවේ. මෙම වගාව රැකගැනීමට ගොවීන් දැඩි පරිශ්‍රමයක් දරයි. මේ සදහා ඉඩම් වටා නීත්‍යානුකුල හා නීත්‍යානුකුල නොවන අක්‍රමවත් අලිවැට යොදාඇත.

මෙම ප්‍රදේශයේ දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් අතිරේක බෝග වගාව සඳහා රටකජු හා තල මිරිස් කව්පි වැනි බෝග ගොවීන්ට  වගාව සදහා ලබා දී ඇත.

වගු අංක 11- අබන්පොල (DSC) හි ඉඩම් පරිහරණ ව්‍යාප්තිය

| ඉඩම් පරිහරණ වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|
| ප්‍රධාන වගාවන් (පොල්) | 83.3 |
| වෙනත් ස්ථිර භෝග | 46.82 |
| වී | 3401.42 |
| වෙනත් වාර්ෂික භෝග (ගෙවතු) | 1603.15 |
| ජල මූලාශ්‍ර (ටැංකි, ජලාශ, වාරිමාර්ග යෝජනා ක්‍රම, ගංගා) | 1706.55 |
| ඕටුන්න හිමි ඉඩම | 7918.00 |
| බැරන් ඉඩම / වගුරු බිම | 8.92 |
| සොහොන් බිම / පොදු භාවිතය | - |
| වනාන්තර ඉඩම | - |
| ලඳු කැලෑව | 1162.72 |
| වෙනත් පාෂාණමය ඉඩම | 10.84 |
| එකතුව | 15,941.72 |

මූලාශ්‍රය: අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ, 2018

## 04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

තම්මැන්නාව එල්ලංගාවේ පැවති හරස්කඩ වාරිකාවේදී මෙන්ම ගොවි සංවිධාන හා නිලධාරීන් සමග සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණයකර ගතහැකි විය. එල්ලංගා හරස්කඩ වාරිකාවෙන් පසු ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේදී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකිවිය. මෙසේ හදුනාගත් ගැටලු ගොවින්ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක් ද කල අතර ඒ අනුව පහත සදහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත. තවද උපාය මාර්ගික මැදිහත්වීම් හා මැදිහත්විය යුතු  ආයතන පිළිබදව තක්සේරුවක් කර දළ ඇස්තමේන්තුවක් සකස්

කර කාල රාමවක්ද අමුණා ඇත. මෙම වාර්ථාව එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර සාකච්ඡා කර ක්‍රියාවට නැංවිය යුතුය .

වගු අංක 12 - උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

| අනු අංක | උග්‍ර ගැටළු | යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් | මැදිහත්විය යත ආයතන |
|---|---|---|---|
| 1 | පනාදරගම වැවේ වැවේ ජලය වගාවට ප්‍රමාණවත් නැත. (වාන පාහත්)<br><br>පනාදරගම වැව කුඩා වැව | 1. කොන්ත්‍රාත් කරුවන් පාර්ෂව කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMCහිදී සාකච්ඡා කිරීම.<br>2. රුඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම. | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ<br>5 කෘ දෙ |
| 2 | කට්ටකඩුව හා පෙරණය නැත. (පනාදරගමවැව කුඩා වැව තම්මැන්නාව අංකිරිප්පුව) | 1. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම.<br>2. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම.<br>3. කට්ට කඩුව නිරීක්ෂණය කර ඒකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ටකඩුව වෙන් කිරීම.<br>4. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම . | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 3 | රක්ෂිත අල්ලාගෙන ඇත (පුද්ගලිකපාරකට දාගෙන පනාදරගමවැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව) | 1. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |

| | | | |
|---|---|---|---|
| | | 2. ඒකාබද්ධ සැලසුමක් සකස් කිරීම<br>3. වැව් මැන සළකුණු කිරීම<br>4. අණුවසර කරුවන් ඉවත් කිරීම | |
| 4 | ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම.(කුඹුරු විනාශවී ඇත පනාදරගම) | 1. කොන්ත්‍රාත් කරුවන් පාර්ෂව කරුවන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම.<br>3. ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රතිපාදන සපයා ගැනීම.<br>4. කොන්ත්‍රාත් ගොවි සං විධානයට පැවරීම හා ප්‍රගතිය පරීක්ෂාව. | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 5 | පුණරුත්ථාපණයේදී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවක සේදී වැවට එකත වී වැව ගොඩවීම.<br><br>(අඩි 4 පමණ උස හා මීටර්300 පමණ) | 1. කොන්ත්‍රාත් කරු වන් පාර්ෂව කරු වන් හා ව්‍යාපෘති නිධාරීන් සමග CMC හිදී සාකච්ජා කිරීම .<br>2. රැඳවුම් මුදල් මගින් ප්‍රතිපාදන සපයා ගැනීම . | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| | | | |

| | | | |
|---|---|---|---|
| 6 | කෘෂි පාර නැත (කට්ටකඩුව සිට අංකිරිප්පව දක්වා මී 500 හා පකාදරගම වානේ සිට කුඹුරු දක් වා කෘෂිපාර නැත ම 750) | 1. ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම<br>2. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා හා ඇස්තමේන්තුවක් ලබාගැනීම<br>3. ප්‍රතිපාදන සපයා ගැනීම<br>4. ගොවි සංවිධානය මගින් අලුත්වැඩියා කිරීම | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 7 | අංකිරිප්පුවේවැවේ පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් කරලා අක් 01 ට ජලය ගන්න බෑ | 1. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම<br>2. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා කොන්ත්‍රාත් කරුවන් මගින් නැවත ඉදිකිරීම | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 8 | වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්ත ඉතා දුර්වලයි | 1. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම<br>2. නඩත්තු සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |

වගු අංක 13 -යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව

| උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම් | දළ පිරිවැය (රු.මි) | කාල රාමුව | | | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතන මැදිහත්වීම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෙටි කාලීන 2024 | | | | | | මධ්‍යකාලීන 2025 | | | | දිගුකාලීන | | | | | |
| | | | | | | | | | | | | | | | | ප්‍රධාන | අනෙකුත් |
| 1 පනාදරගම වැවේ වැවේ ජලය වගාවට ප්‍රමානවත් නැත (වාන පාහත්කරලා)<br>නියමිත මට්ටමට වාන ඉස්සීම<br>පනාදරගමවැව<br>කුඩා වැව | 0.3 | | | | | | | ▬ | ▬ | ▬ | | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ | දේශගුණ සුහුරු වාරි<br>ගොවිජන සංවර්ධන |
| 2 කට්ටකඩුව හා පෙරණය (Filter)නැත. නැවත ස්ථාපිත කිරීම<br>පනාදරගමවැව කුඩා වැව<br>තම්මැන්නාව අංකිරිප්පුව | 0.6 | | | | ▬ | ▬ | ▬ | | | | | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ගදෙ | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 3 රක්ෂිත අල්ලාගෙන ඇත<br>වැවේ රක්ෂිතය සළකුණු කර අණුවසර කරුවන් ඉවත් කිරීම<br>පනාදරගවැව කුඩාවැව<br>තම්මැන්නාව ඉහල වැව | 0.4 | | | | | | | | | ▬ | ▬ | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 4ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම. ඇල සකස් කිරීම(කුඹුරු විනාශවී ඇත . පනාදරගම) | 0.3 | | | | | | ▬ | ▬ | | | | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 5 පණරුත්ථාපණයේදී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවත සේදී වැවට එකත වී වැව ගොඩවීම. පස් වැටිය සකස් කර පෙරණය දැමීම (අඩි 4 පමණ උස හා මීටර් 300 පමණ දිගට) | 0.2 | | | | | | | ▬ | ▬ | | | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 6 කෘෂි පාර නැත .කෘෂිපාර අලත්වැඩියාව (කට්ටකඩව සිට අංකිරිප්පුව දක්වි මී 500 හා පකාදරගම වානේ සිට කුඹුරු දක්වා කෘෂිපාර නැත මි 750) | 0.7 | | | | | | | | | | | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 7. අංකිරිප්පුව වැවේ පැවති වේල්ල කොන්ත්‍රාත් කරු ඉවත් කරලා අක් 01 ට ජලය ගන්න බැ. ඇල නැවත සකස් කිරීම. | 0.3 | | | | | ▬ | ▬ | | | ▬ | ▬ | ▬ | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත . නඩත්තු ඉතා දුර්වලයි<br>විධිමක් නඩත්තු වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම. | 0.1 | | | | | | | | | | | | | | | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |

වගු අංක 14 -තම්මැන්නාව එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තුව

| | | | | |
|---|---|---|---|---|
| | | | 2024/2025 | |

| අනු අංක | දළ ඇස්තමේන්තුගත වියදම / සහ<br>යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් තම්මැන්නාව එල්ලංගාව | ආසන්න වියදම් (රු.) | ඔ/නො | දෙ/ජන | මා/අප්‍රි | මැ/ජ | ජ/අ | සැ/ඔ | නෙ/දෙ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | පනාදරගම වැවේ වැවේ ජලය වගාවට ප්‍රමානවත් නත. වාන පාහත් ඉදි කිරීම | 0.3 | | | | | | | | |
| 2 | කට්ටකඩුව හා පෙරණය නැත(පනාදරගමවැව කුඩා වැව .තම්මැන්නාව අංකිරිප්පව) කට්ටකඩුව හා පෙරණය දැමීම් | 0.6 | | | | | | | | |
| 3 | රක්ෂිතය අල්ලාගෙන ඇත (පනාදරගම,වැව කුඩාවැව තම්මැන්නාව ඉහල වැව) රක්ෂිත වෙන්කර සලකුණු කිරීම. | 0.4 | | | | | | | | |
| 4 | ඇල කඩාගෙන ගොස් ජලය අපතේ යාම. (කුඹුරු විනාශවී ඇත . පනාදරගම) (ඇල අලුත්වැඩියා කිරීම) | 0.4 | | | | | | | | |
| 5 | පුණරුත්තාපණයේදී වැව් ඉස්මත්තට ගොඩ දමා ඇති පස් නැවත සේදී වැවට එකතු වී වැව ගොඩවීම. (අඩි 4 පමණ උස හා මීටර් 300 පමණ දිගට ) | 0.4 | | | | | | | | |
| 6 | කෘෂි පාර නැත. ( කට්ටකඩුව සිට අංකිරිප්පුව දක්ව්වා මී 500 හා පනාදරගම වානේ සිට කුඹුරු දක් වා කෘෂිපාර සැදීම මී 750) | 0.2 | | | | | | | | |
| 7 | අංකිරිප්පුව පැවති වෙල්ල කොන්ත්‍රාත් කරු ඉවත් නරලා (නැවත සැදීම ) | 0.2 | | | | | | | | |
| 8 | වාරිමාර්ග පද්ධතිය නඩත්ත ඉතා දුර්වලයි(නඩත්තු සැලැස්මක් ක්‍රියාත්මක කිරීම් ) | 0.2 | | | | | | | | |
| | එකතුව | 2.4 | | | | | | | | |

# ඇමුණුම්

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කරඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | 7/3/9/CMC/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2023.08. 03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>
**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රීයව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සෑම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## 3.4. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවේ සංයුතිය

### 3.4.1 ප්‍රාදේශීය මට්ටම

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරී
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරී
ix. ආර්ථික සංවර්ධන නිලධාරී
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරී
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

*සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ ඒකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.*

### 3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

### 3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාභායාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)